දැන්වීමයි

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පත් කිරීම 2020

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 63 ක ප්‍රමාණයක් සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත පිරවීමට අදාළව 2020.11.16 දින දිණමිණ, තිනකරන් හා ඩේලිනිවුස් පුවත්පත්හි පළකර ප්‍රසිද්ධ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි 06 යටතේ දක්වා ඇති යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පරිදෙන් වඩාත් පැහැදිලි වනසේ සංශෝධනය කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙමගින් දන්වා සිටිමි.

අනු අංකය	විෂයය		උපරිම ලකුණු
01	**ජ්‍යෙෂ්ඨත්වය**		60
	I. 2007.05.28 දිනැති අංක 1499/5 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට (පැරණි සේවා ව්‍යවස්ථාව) අනුව ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පන්තියේ I ශ්‍රේණියට උසස්වීමට සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද දින සිට එම සේවා ව්‍යවස්ථාව අනුව III පන්තියේ I ශ්‍රේණියට උසස්වීම් ලද දිනය හෝ 2019.09.27 දිනැති අංක 2142/75 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පන්තියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද දිනය දක්වා වූ පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ III පන්තියේ II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා (වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු ලබාදී ඊට සමානුපාතිකව අදාළ සෙසු අයදුම්කරුවන්ට ලකුණු ලබාදීම සිදුවේ.)	25	
	II. 2007.05.28 දිනැති අංක 1499/5 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට අනුව III පන්තියේ I ශ්‍රේණියට උසස්වීම් ලද දින සිට හෝ 2019.09.27 දිනැති අංක 2142/75 දරන ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පන්තියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද/ උසස්වීම් ලද දින සිට අයදුම්පත් කැඳවන අවසාන දිනය දක්වා වූ, සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා (වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී ඊට සමානුපාතිකව අදාළ සෙසු අයදුම්කරුවන්ට ලකුණු ලබාදීම සිදුවේ.)	35	
02	**කුසලතාවය**		30
	I. **බඳවා ගැනීමේ මූලික සුදුසුකමට අමතරව ලබා ගත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් - (තනතුරට අදාළ වන ක්ෂේත්‍රයන් තුළ)** 1.1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්‍ය දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (MSc in Real Estate Management &Valuation) - (ලකුණු 12) **හෝ** එක්සත් රාජධානියේ රෙඩින් විශ්වවිද්‍යාලය (University of Reading-UK) / එක්සත් රාජධානියේ තත්‍ය දේපළ කළමනාකරණය පිළිබඳ විශ්වවිද්‍යාල ආයතනය (University College of Estate Management) මගින් පිරිනමන තත්‍ය දේපළ පිළිබඳ පශ්චාත් උපාධිය (MSc in Real Estate) - (ලකුණු 12) 1.2 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්‍ය දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ලකුණු 06) (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)	12	
	II. **වෘත්තීය සුදුසුකම්** 1.1. **අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වය සඳහා** 1. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය (Institute of Valuers of Sri Lanka)- (ලකුණු -05) **හෝ** 2. එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ තක්සේරු සාමාජිකත්වය (Members of Royal Institute of chartered Surveyors/ Fellow of the Royal Institute of chartered Surveyors) - (ලකුණු - 05) 1.2. තක්සේරු වෘත්තියේ බඳවාගනු ලබන තනතුරට අදාළව ඉහත 2.I.1.1. හා 2.I.1.2. ට අමතරව පිළිගත් ආයතනයකින් ලබාගත් දේශීය හා විදේශීය වසරක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 01 බැගින් උපරිමය ලකුණු 03) - (ලකුණු 03)	08	
	III. **වෘත්තීය කාර්ය සාධනය දෙපාර්තමේන්තුගත කාර්ය සාධන ඇගයුම් ක්‍රමවේදයට අනුව පසුගිය වසර 05 ක සමස්ථ කාර්ය සාධන ඇගයුම** 01. විශිෂ්ඨ කාර්ය සාධනය (මාසික සාමාන්‍යය 17.5 ට වැඩි)(ලකුණු 10) 02. සාමාන්‍ය කාර්ය සාධන මට්ටම (මාසික සාමාන්‍යය 12.5- 17.49) -(ලකුණු 07) 03. සතුටුදායක කාර්ය සාධන මට්ටම (මාසික සාමාන්‍යය 10.0-12.49) - (ලකුණු 05)	10	
03	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා		10
	මුළු එකතුව		100

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
රජයේ ප්‍රධාන තක්සේරුකරු,
2021 ජූලි මස 17 දින දිය.